# 1931 අංක 19 දරණ විහාර දේවාල ගම් ආඥා පණත හේතුකොට ගෙන වර්තමානයේ උද්ගතවී ඇති ගැටලු සහ එම ආඥා පණත සංශෝධන කිරීමේ අවශ්‍යතාවය

ආණමඩුවේ ධම්මදස්සි හිමි[1]

## හැඳින්වීම

වර්තමාන ශ්‍රී ලංකාවේ විහාරස්ථාන සහ සිද්ධස්ථාන යන්නටම අන්තර්ගත කර ඇති බෞද්ධ ආයතන ලෙස විටෙක සලකනු ලබන ඉපැරණි දේවාල ආදියටද බලපාන අණ පණත් අතර සුවිශේෂි පණතක් ලෙස, 1931 වසරේ සම්මත කර ඇති අංක 19 දරණ විහාර දේවාලගම් පණත හඳුන්වා දිය හැකිය. නිදහස ලැබීමට පෙර පිහිටුවා තිබූ නිතිදායක මන්ත්‍රන සභාවේ අනුමැතිය යටතේ ඉංග්‍රීසින්ගේ බලය මෙරටෙහි ක්‍රියාත්මක වන අවදියේදී සැකසූ මෙය එවකට සිටි ගිහි පැවිදි බෞද්ධ පිරිසගේ නිදහස් අදහස්වලට අනුව සැකසූවක්ද යන්න ගැන සොයා බැලිය යුතුවේ. ඒ, 1948 වසර වනවිට නිදහස ලබා මෙරටෙහි බොහෝ වෙනස්කම්ද සිදුවූ නිසාවෙනි. එසේ වුවත් අපේ රටේ දේශීයත්වය, ආගමික භාවය සහ ඉපැරණි චාරිත්‍ර මෙන්ම සම්ප්‍රදායයන් සුරක්ෂිත කර ගැනීමටද වෙහෙර විහාර සහ දේවාල ආදියට ඒවායේ දේපළ සුරක්ෂිත කර ගැනීමටද මෙතෙක් බලපෑවේ මෙම පණතෙහි වගන්ති සමුදාය යැයි දැක්වීම, නිවැරදිය. ඉංග්‍රීසීන් මෙබඳු පණතක් හෝ සම්මත කර දීමේ වැදගත්කමද මෙහිදී අවධානයට ලක්විය යුත්තකි. ශ්‍රි දළදා මාළිගාව මෙන්ම ශ්‍රි මහාබෝධිය ආදි සුවිශේෂ ආයතනවලට එවකට පැවති චාරිත්‍ර ආරක්‍ෂා වන පරිදි කිසියම් පරිපාලන ක්‍රමයක්ද මෙමගින්ම සකසා දී ඇති බවද නොරහසකි.

එහෙත් මේරටේ විහාරස්ථානවලටද දේවාලවලටද විහාරාධිපති සහ භාරකාර තනතුරු ඇති කරලීම මගින් එතෙක් නොමැති ගැටලු රැසක් පැන නැගී එම ආයතන පෞද්ගලික පාලනයකට මෙන් ගමන් කළේද මෙම පණතෙහි පවතින වගන්ති නිසා බව පෙනෙන්නට තිබේ. භික්‍ෂුන් වහන්සේලාටද ගිහී භාරකරුවන්ටද මෙම පණත නිසා ආයතන සතු ඉඩම් පරිහරණය කිරීමට යාමේදීද ඒවා බදුදීමේදීද විශාල ගැටලු පැන නැගී ඇත. බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට වාර්ෂිකව අය වැය සකසා පෙන්වාදීමටද මෙම පණත අනුව කළ යුතු බැවින් එමගින්ද ගැටලු රැසක් පැන නැගී ඇත. බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාගේ බලතල පිළිබඳවද වර්තමානයේ බොහෝ විවේචන පවතී. ශ්‍රි දළද මාළිගාවේ පරිපාලන කාර්යය සහ දියවඩන නිළමේවරයා පත් කිරීමේ ඡන්ද ක්‍රමය ගැනද විවිධාකාර මතවාද

---

[1] කථිකාචාර්ය, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශය-ශ්‍රි ලංකා භික්‍ෂු විශ්ව විද්‍යාලය- අනුරාධපුර. anadhassithero@yahoo.com



BHIKSHU UNIVERSITY OF SRI LANKA
07 APR 2015
LIBRARY

මෙරටෙහි පවතී. මෙම පණත කල්ගතවූ පණතක් වන බැවින් සම්පූර්ණ පණත කෙරෙහිම අවධානය යොමුකර ප්‍රමාණවත් සංශෝධනයක් සිදුකර නොමැතිවීමද වර්තමානයේ පවතින ප්‍රධානම ගැටලුවක් වී තිබේ. එහෙයින් වර්තමානයට උචිත පරිදි මෙය සංශෝධනය විය යුතුව පවතින බැවින් ද සහ ඒ කෙරෙහි මෙරටෙහි අවධානයක් යොමු කිරීමද දැනට ඉදිරිපත්වී ඇති යෝජනා සහ අදහස් සලකා බැලීමද ඒ අනුව සිදුකළ යුතු සංශෝධන ගැන සාකච්ඡා කිරීමද මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වේ.

**පර්යේෂණ ක්‍රමය සහ පර්යේෂණ කාර්යය**

මෙය විහාර දේවාලගම් පණත නම් වූ සන්දර්භය හෙවත් එයට අදාළ වගන්ති ආදිය මුල් කොට ගෙන ඒවා විශ්ලේෂණය කරන කාර්යයක් වන නිසා මෙය සන්දර්භ විශ්ලේෂණ ක්‍රමයට අනුගත පර්යේෂණයකි. (CONTENT ANALYSIS).එම සන්දර්භය තුළ පවතින ක්ෂේත්‍රය කෙබඳුදැයි හඳුනා ගෙන එයට අදාළව පසුකාලීනව වසර කීපයකදී සිදුකළ සංශෝධනයන් සොයා බලා එම සංශෝධන වර්තමාන විහාර සහ දේවාල ගම් ආදියෙහි සංරක්ෂණයට සහ ඒවායේ අභිවර්ධනයට ප්‍රමාණවත් වේද යන්න සලකා බැලීමත් මෙහි සිදු කෙරෙන කාර්යය වේ.

**විහාර දේවාගලම් පණතෙහි සංක්ෂිප්තයක් සහ ඒ හා සබැඳි ගැටලු සැකෙවින්**

1905 විහාර දේවාගලම් පණතේ විධිවිධානයන්ගෙන් බෞද්ධ විහාර දේවාලගම්වලට සෑහෙන පමණ ආරක්ෂා නොලැබී තිබෙන බව පෙනී යන බැවින්ද එබඳු විහාර දේවාල ගම්වලට එසේ සෑහෙන පමණ ආරක්ෂාව ලැබෙන පරිදි ඒ පිළිබඳව පාලන සංවිධාන ක්‍රමයක් සැලසීම යෝග්‍ය බැවින්ද ලංකාණ්ඩුකාර උතුමාණන්විසින් නීතිදායක සභාවේ අනුශාසනයෙන් සහ අනුමැතියෙන් පහත දැක්වෙන පරිදි පණවනු ලැබේ[22] යයි මේ පණත ආරම්භයේ දක්වා ඇත. එම පණත අවසානයේ 1905 වසරේ තිබූ මෙබඳු පණතක් ගැන සහ 1919 වසරේ අංක 15 දරණ සංශෝධන පණතක් ගැනද සඳහන් වන බැවින් මෙම ක්ෂේත්‍රය දෙස මීට පෙරද ඉංග්‍රීසීන් අවධානයක් යොමු කර තිබූ බව පෙනේ. දැනට පවතින පණත සංක්ෂිප්ත කොට පහත දැක්වෙන පරිදි ඉදිරිපත් කළ හැකි අතරම වර්තමානයේ ඇති ගැටලු කීපයක් එහිදීම දක්විය හැකි වේ.

**භාගය- ප්‍රාරම්භය**

මෙහිදි සිද්ධස්ථානය, භාරකාරයා, භික්ෂු, විහාරාධිපති, පරවේණි පංගුව, මාරුවෙන පංගුව, විනිශ්චය සභාව යන පදවලට සැකෙවින් අරුත් විවරණ දක්වා ඇත. ඒවායෙහිද නව සංශෝධන ඇවැසි බව පෙනේ. උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ පිහිටි ථෙරවාදී සම්ප්‍රදායික විහාරස්ථාන සහ ඒ හා සබැඳි ථෙරවාදී සම්ප්‍රදායික භික්ෂූන්

පමණක් මෙම පණතට ඇතුළත් විය යුතුව තිබේ. විහාරස්ථානවලට අයත් දේපළ පාලනය කිරිමේදී ආදායම් තත්වය මත දැනට භාරකාර හිමිවරු ලෙස විශේෂිතව පත් කෙරෙන ආයතනවලට එක් ක්‍රමයක්ද එසේ නොවන ඒවාට පාලක විහාරාධිපති හිමිවරුන් යනුවෙන් තවත් ක්‍රමයක්ද දක්වා උන්වහන්සේලාට ඒවායෙහි පාලනය පවරා ඇත. එහෙත් වර්තමානයේ පවතින බොහෝ විහාරස්ථානවලට විහාරාධිපති හිමි වෙනුවෙන් ක්‍රියාත්මකවීමේ අවශ්‍යතාවයක් පවතින නිසා එම පරම්පරාවලට අයත් හිමිවරුන්ට කිසියම් පරිපාලනමය වගකීමක් පැවරීමේ ක්‍රමයක්ද දැනට යෝජනා වී ඇත. අටමස්ථානය යන්නට ඇතුළත් ආයතන නම්කර නොතිබීම නිසා එම අවශ්‍යතාවයද වර්තමානයේ පැන නැගී ඇති අතර පොළොන්නරු සොළොස්මස්ථානයද නම් කර මෙයට ඇතුළත් කළ යුතු බවටද උභය මහා විහාරවලින් අදහස් දක්වා ඇත. උඩරට පළාත යන්නට නිශ්චිත ප්‍රදේශයක්ද මෙහිදී දැක්විය යුතු නමුදු යෝජනා වී ඇති හිනිදුම් පත්තුව සහ මොරවක් කෝරළේ යන ප්‍රදේශවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ (දෙක) සහ 1952 අංක 44 දරණ උඩරට විවාහය සම්බන්ධ පණතෙහි පළමුවන සහ දෙවන උපලේඛණවල දැක්වෙන ප්‍රදේශය යන්න ගැනද විවිධ අදහස් පළ වී ඇත. බලයලත් ප්‍රමාණයකට මේ සියලු ආයතන බෞද්ධ කොමසාරිස්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත් වන බවද පණතෙහි දැක්වෙන අතර දැනට මෙය බෙහෙවින් සංවාදයට ලක් වී ඇත. එනමුදු මෙම කාර්යයේදී උපදේශක සභාවක ආධාර කිරීමක්ද පණතෙහිම දක්වා ඇති බවද පෙන්වා දිය හැකිය.

**භාගය-භාරකාරයෝ**

දියවඩන නිළමේ දළදා මාළිගාවේ ගිහි භාරකරු වන නිසා මෙතෙක් පැවති ක්‍රමයකට අනුගතව එම තනතුරට පත් කිරීමේ ක්‍රමයක් දක්වා ඇත. මෙහි පාලනය ගැනද දියවඩනේ නිළමේ තේරිමේදී පවතින ඡන්ද ප්‍රමාණයද ගැන සහ මහනුවර නගරයේ පවතින සිවු මහා දේවාලවල බස්නායක නිළමේවරු තේරිමේදීද පවතින ඡන්ද ප්‍රමාණයද ගැන අස්ගිරි මල්වතු මහා විහාර දෙකෙන්ම මෙයට සංශෝධන ඉදිරිපත් කර ඇත. ඉන්පසු මෙම කොටසෙහි දැක්වෙනුයේ විහාරස්ථාන සහ දේවාල අතරින් සුවිශේෂි ඒවාට පත්කෙරෙන භාරකාරුවන්ට අදාළ කාර්යයන්, ඔවුන්ගේ කාලසීමාවන් සහ එම පත්කිරීම්, වෙනස් කිරීම් ආදි කරුණු වේ. අටමස්ථාන සභාව සහ එහි පත් කිරීම්, එහි කාර්යන් ආදියද මෙම කොටසෙහිම දැක්වේ.

**භාගය-දේපළ**

සිද්ධස්ථානවලට අයත් වී තිබෙන සහ විවිධාකාරයෙන් ලැබෙන නිශ්චල චංචල දේපළ හා ඒවායෙහි පරිපාලනය ගැනද බලාධිකාරිත්වයකින් ඒවා පාලනය කිරීමේ අවශ්‍යතාවය ගැනද මෙම කොටසෙහි දැක් වේ. මුදල් බැංකු ගත කිරීම්,

ඉඩම් බදුදීම්, ආදායම් යෙදිය යුතු අංශ ආදිය ගැනද මෙහි දැක් වෙන අතර සහ අනිසි ලෙස අන්සන්තක ගම්බිම් කෙත්වතු වෙනුවෙන් නඩු පැවරීම් ආදිය ගැනද සිද්ධස්ථාන සන්තක දේවල් බුක්තියට සවිනොවන ආකාරය ගැනද මෙහි වගන්ති දැක්වේ. මේවැනි දේවලට විහාරාධිපති සහ භාරකාරුවන් විවිධාකාරයෙන් නඩුපවරා ඒ වෙනුවෙන් වෙහෙසවීමද ඒ නිසාම භික්ෂු ප්‍රතිරූපයට හානියක් සිදුවීමද විශාල කාලයක්ද ධනයක්ද වැය කිරීම ආදි ගැටලු රැසක් මේ නිසා දැනට පැන නැගී ඇත. මෙය වෙසෙසින් සාකච්ඡාවට ලක්විය යුතු වේ.

**භාගය- ගණන් තැබීම හා විගණනය**

භාරකාරයා වාර්ෂිකව සැලසුම් සකසා බෞද්ධ කොමසාරිස්වරයාට ගණන් තැබිය යුතු බව සහ සමාසිකව ඒවා වෙන් වෙන්ව පෙන්වා දිය යුතු බවද විහාරාධිපති හිමියන් එහිදී සහාය දැක්විය යුතු ආකාරයද මෙම කොටසේ සඳහන් වේ. ගණන් පරීක්ෂා කිරීමේ බලයක් බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට ලැබී ඇති ආකාරයද ඒවා නිවැරදිව සිදු නොවූ විට කොමසාරිස්වරයාට භාරකාරයාට එරෙහිව නඩු පැවරීමේ හැකියාවක් තිබීම යනාදියද මෙම කොටසෙහිම දැක්වේ. ගණන් තැබීම ආදි කටයුතු, භාරකාර හිමිවරුන් විසින් ලිපිකරුවන් තබා ගෙන සිදුකළ යුතු කාර්යයන් වන නිසා ඒවාට ප්‍රමාණවත් ගෙවීම් ආදි ගැටලුද පැන නැගී ඇත. එහෙත් එවැනි භාරකරුවන් සිටින විහාරස්ථාන ඇත්තේ සීමිත ප්‍රමාණයක් නිසා එය ගැටලුවක් සේ සමාජයට පෙනී ගොස් නැති බවක්ද පෙනෙන්නට තිබේ.

**භාගය - නා නා කරුණු**

මෙම පණත යටතේ බල පැවැත්වීමට ඇති සාමාන්‍ය සුදුසුකම් ආදිය එනම් වයස 21ට වඩා වැඩි කෙනෙකුටද බෞද්ධාගමිකයකුටද මෙම පණත යටතේ ඇති තනතුරු දැරීමට ඇති හැකියාව, උපසම්පන්න සහ සාමණේර භික්ෂූන් රජයේ ලියාපදිංචි වීමේ අත්‍යාවශ්‍ය භාවය, එයට කාලසීමා පණවා තිබීම, එසේ නොකළ හොත් ඒ සැමටම සහ ආචාර්යවරයාටද පළාතේ නාහිමියන්ටද අදාළ මහානායක මාහිමියන්ටද දඩගැසීමේ හැකියාව, මෙම කොටසෙහි දැක්වේ. බොරුවට භික්ෂුවක් මෙන් පෙනී සිටීම නිසා ඒවාට දඩගැසීමේ හැකියාවද, ඓතිහාසික ආයතන සහ ඒවායේ වස්තූන් රැකීමද ඒවායේ වෙනස්කම් කිරීමේ නොහැකියාවද බදුමුදල් සහ ලැබෙන පුදපූජා සම්මාදම් ආදිය සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාවයද පණත ප්‍රකාරවූ ඡන්ද හිමි අයගේ නාමලේඛන සැකසීමේ විධිවිධානද මෙම කොටසටම අයත් වේ. මේවා පිළිබඳව මෑතක සිට බොහෝ ගැටලු පැන නැගී ඇත. පුරාවිද්‍යා පණතෙහි ඇති නියමයන්ද මේවාට බලපා ඇති බැවින් ඒ ගැන විවිධ පිරිස් අදහස් දක්වා ඇත.

**භාගය-තාවකාලික විධිවිධාන හා ව්‍යවස්ථා අස්කර ගැනීම**

අලුත් භාරකරුවන් පත්කරන තෙක් හිටපු භාරකරුවන් ක්‍රියාකිරීම, දියවඩන නිළමේගේ සහ බස්නායක නිළමේවරුන්ගේ භාරකාරකම්වල කාල සීමාව, එතෙක් පැවති කාරක සභාවල දේපළ ආදිය මහාභාරකරු වෙත පැවරිය යුතු බව, ව්‍යවස්ථා අස්කර ගැනීම සහ මීට පෙර පැවති පනත් අවලංගු කිරීම ආදි කරුණු මෙම කොටසෙහි දැක්වේ.

**1931 විහාර දේවාගම් පණතට පසුකාලීනව සිදුකර ඇති සංශෝධන**

1980 අංක 22 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පණත

1981 අංක 18 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පණත

1981 අංක 42 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පණත

1992 අංක 03 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පණත

2013 අංක 34 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පණත ආදි ලෙසින් මෙම පණතට සුළු සුළු සංශෝධන කීපයක් සිදුකර ඇත.

**ප්‍රමුඛ පදඃ** විහාරාධිපති, පාලක විහාරාධිපති, භාරකරු, උඩරට පළාත, භික්ෂු ලියාපදිංචි කිරීම්

**ආශ්‍රිත ග්‍රන්ථ**

රාජපක්ෂ, විජේදාස, (2010). *බෞද්ධ විනය විහාර සම්ප්‍රදාය සහ අද්‍යතන නීතිය.* කුරුණෑගලඃ චම්පිකා ප්‍රින්ටර්ස්.

නන්ද හිමි, බලන්ගොඩ. (1992). *බෞද්ධ ආරාම සංවිධානය.* කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මසිරි හිමි, මිරිස්සේ. (1978). *සංඝාධිකරණ ජෝතිකා.* රත්මලානඃ සිරිසර මුද්‍රණාලය.

*බුවනෙකබා* (ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය), ඉන්ද්‍රානන්ද හිමි, වැලිපිටියේ. (2013). *විහාරාධිපති තනතුර පිළිබඳ නීතිය සහ සම්ප්‍රදාය* (ලිපිය), කාංචන ප්‍රින්ටර්ස්, නුගේගොඩ.

*අපේ සංස්කෘතික උරුමය.* (ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය). (1995). කොළඹඃ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රකාශනයකි.